පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# දෙවන වාර පරීක්ෂණය - 2017

## ක්‍රිස්තියානි ධර්මය

ශ්‍රේණිය 12

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ..................................................

.................................................... කාලය : පැය 02 යි.

## I කොටස

❖ **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

❖ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.** (1x50 =50)

01. ශු. බයිබලය පළමුවෙන් ලේඛන ගත වූයේ,
    i. ගල් පුවරුවල ii. හම් වල iii. පැපිරස් වල
    iv. කඩදාසි වල v. හැකුළුම් පත් වල

02. පැරණි ගිවිසුමට අයත් පොත් කාණ්ඩයක් නොවන්නේ,
    i. පංච පුස්තකය ii. ඉතිහාස පොත් iii. ප්‍රඥා පොත්
    iv. දිව්‍යසාවලිය v. ලිපි හා සන්දේශ

03. නව ගිවිසුම පුරාණ ගිවිසුම තුළ සැඟවී ඇති බව ප්‍රකාශ කළේ ,
    i. ශු. අගොස්තීනු තුමා ii. ශු. ජෙරොම් තුමා iii. ශාන්ත සිරිල් තුමා
    iv. ශු.පාවුළු තුමා v. ශු. සිරිල් තුමා

04. භූගෝලීය කලාප වෙන් කිරීම අනුව කාර්මෙල් කඳු වැටිය පිහිටි කලාපය,
    i. මුහුදු තීරය ii. බටහිර කඳු iii. ජෝර්දාන් නිම්නය
    iv. කාන්තාරය v. නැගෙනහිර කඳු

05. ශු. බයිබලයේ ප්‍රධාන තේමාව,
    i. මෝසෙස් තුමා ii. මරියාවන් iii. සීනායි ගිවිසුම
    iv. ජේසුස් වහන්සේ v. ශු. සභාව

06. මිනිසා දූවිල්ලෙන් මැවීමෙන් සංකේතවත් වූයේ,
    i. මිනිසා දෙවියන් හා සමාන බව ii. දෙවියන් වහන්සේ සියල්ලට අධිපති බව
    iii. මිනිසා භෞමික බව iv. මිනිස් දිවියේ අභිරහස v. මිනිසා මැරෙන බව

07. ස්වප්න, දේවදූතයින් , දර්ශන, මගින් දේව අනාවරණයන් ඉදිරිපත් කළ සම්ප්‍රදාය,
    i. J ii. E iii. D iv. P v. L

08. ආදි පිතෘ යුගය ලෙස සැලකෙන්නේ,
    i. ක්‍රි.පූ. 4000 - 3700 අතර ii. ක්‍රි.පූ. 3000 - 2700 අතර iii. ක්‍රි.පූ. 2000 - 1700 අතර
    iv. ක්‍රි.පූ. 2500 - 1900 අතර v. ක්‍රි.පූ. 1000 - 700 අතර

09. ආබ්‍රහම් තුමා අයත් පෙළපත,
    i. ශෙම්ගේ ii. හාම්ගේ iii. ජපෙත්ගේ iv. ජුදාගේ v. දාන්ගේ

10. මැවීමේ දෙවන කතාවට අනුව,පළමු දවසට සමාන්තරව දක්වන ඊළඟ දවස වන්නේ
    i. දෙවන දවස ii. තුන්වන දවස iii. සතර වන දවස
    iv. පස්වන දවස v. හයවන දවස

11. යෙසායා 59/21 ට අනුව දක්වන දේවානුභාවය ,
    i. වාචික ii. ක්‍රියාකාරී iii. ලේඛක iv. පෙළඹවීම v. මෙහෙය වීම

12. ජන නායකයෙකු මෙන්ම පූජක ධූරයද දැරූ පුද්ගලයෙකි,
    i. දෙබෝරා ii. ගිඩියොන් iii. සැම්සන් iv. එස්තර් v. සාමුවෙල්

13. මධ්‍යම කඳුකරයේ උතුරු ප්‍රදේශය සිය පාලන කේන්ද්‍රස්ථානය කරගත් රජෙකි,
    i. සාවුල් ii. සලමොන් iii. දාවිත්
    iv. රෙහෙබෝවාම් v. ජෙරොබෝවාම්

Education NCP - www.edncp.lk

14. ක්‍රි. පූ 62 දී පමණ ජෙරුසලම වටලා මුළු පලස්තීනය පාලනය කළ රෝම සෙන්පතියා වන්නේ ,

i. හෙරෝද් ii. මහා ඇලෙක්සැන්ඩර් iii. පොම්පේ
iv.මහා චාල්ස් v. සීසර්

15. ඊශ්‍රායෙල් සිද්ධස්ථානයක් ඇති කළ පළමු පුද්ගලයා,

i. නෝවා ii. ආබ්‍රහම් iii. ඊසාක් iv. මෝසෙස් v. ජාකොබ්

16. ලෙයා හා රාකෙල් තම බිරින්දෑ වරුන් ලෙස සරණ පාවා ගනු ලැබුවේ,

i. ආබ්‍රහම් ii. ඊසාක් iii. ජාකොබ් iv. ජෝසෙප් v. මෝසෙස්

17. රාම්සෙස් රජ ඊශ්‍රායලයට විරුද්ධව කටයුතු කළේ,

i. ඔවුන් ශක්තිමත් ජාතියක් නිසා ii. විශාල ජන කොටසක් නිසා
iii. මිසරයේ දියුණුව අපේක්ෂා කළ නිසා iv. මිසරයේ භූමි ප්‍රමාණයකුඩා නිසා
v. සතුරු ආක්‍රමණයන් වලදී ඊශ්‍රායලය මිසරයට විරුද්ධ වේ යැයි සිතූ නිසා

18. මිසරයේ පැවති දියුණුවට බල නොපෑවේ ,

i. ගෘහ නිර්මාණ ශිල්පය ii. වාස්තු විද්‍යාව iii. කලාව
iv. විද්‍යාව v. සාහිත්‍යය

19. "මම වනාහි ස්වයං භූ තැනැත් වහන්සේ වෙමි" යන දේව නාමයට වඩාත් ගැළපෙන අර්ථය වනුයේ,

i. උත්තරීතර අසීමිත එකම දෙවියන් වහන්සේ
ii. ඊශ්‍රායෙලයේ සැබෑ දෙවියන් වහන්සේ
iii. තෝරා ගත් ජනතාවගේ දෙවියන් වහන්සේ
iv. යාවේ හැර වෙන දෙවි කෙනෙකු නැත
v. ඊශ්‍රාලෙයට විමුක්තිය ලැබෙන්නේ දෙවියන් වහන්සේ ගෙන් බව

20. "මාගේ සෙනඟගේ දුක්ඛිත තත්වය මම දුටුවෙමි. ඔවුන්ගේ මොර ගැසීමට මම සවන් දුන්නෙමි..." (නික් 3.7 - 9 ) නමැති වදන් වලින් බයබල් ලේඛනයෙන් ද්වනිත කිරීමට උත්සහ ගන්නේ,

i. දෙවියන් වහන්සේ මෙළොවට පැමිණෙන බව
ii. දෙවියන් වහන්සේ ජනතාවට සමීප බව
iii. ඊශ්‍රායෙල් ජනයා දෙවියන්ට නිතර මොර ගැසූ බව
iv. පාලකයන්ගේ පීඩාවන් ප්‍රතික්ෂේප කරන බව
v. දෙවියන් සාධාරණ බව

21. පාළුකරයේ දෙවියන්ට වන්දනා කරීමට අවසර ඉල්ලමින් ඉදිරිපත් කළ වසංගතය ,

i. මැසි උවදුර ii. මැඩි උවදුර iii. කිනිතුලු උවදුර iv. ගඩු උවදුර v. පළගැටි උවදුර

22. ඊශ්‍රායෙල් ජනයා සුවිශේෂි දේව ජනතාවක් ලෙස හැඩ ගැස්වීම ආරම්භ වන්නේ,

i. කානාන් දේශයෙනි ii. මිසර දේශයෙනි iii. ඊශ්‍රායෙල් දේශයෙනි
iv. රතු මුහුද තරණයෙනි v. රෙපිඩිම් නම් ස්ථානයෙනි

23. මෝසෙස් රජ වාසලින් ලබා ගත් අත්දැකීමක් නොවන්නේ,

i. රණ ශිල්පය ii. පරිපාලනය iii. තාක්ෂණික දැනුම
iv. නීති ක්ෂේත්‍රය v. ඒක දේව වන්දනාව

24. මස්සා හා මෙරීබා යනු පාළුකරයේදී ඊශ්‍රායෙල් ජනයාට ජලය ලැබුනු ස්ථාන දෙකකි. **මස්සා** යන්නේ අර්ථය,

i. පරික්ෂා කිරීම ii. ආමන්ත්‍රණය කිරීම iii. පිපාසය
iv. අත් හැරීම v. දොස් පැවරීම

25. පුරාණ ගිවිසුමට අනුව "බොදුන",

i. සාමුහිකත්වය හා සහජීවනයයි ii. සාමුහිකත්වය හා ප්‍රේමය iii. සහජීවනය හා දයාවයි
iv. සාමය හා සමගියයි v. එකමුතුකම හා තෘප්තියයි

26. පාස්කු පිළිවෙතේ නුමුහුන් පූප භාවිතයෙන් අර්ථවත් වූයේ,

i. මංගල්‍යයක් බව ii. දේව නියමය කඩිනම් බව
iii. දෙවියන් සමග ඇති කර ගත් ගිවිසුම iv. වහල් කමේ අමිහිරි බව v. උත්සවය සැමරීම

27. සීනායි ගිවිසුමේ දෙවන අදියරේ ප්‍රධාන පිළිවෙත,

i. පවිත්‍ර වීම ii. නියෝග සටහන් කිරීම iii. ලේ ඉසීම
iv. දිව්රා වීම v. සාක්ෂි කරුවන් කැඳවීම

28. ද්විතීය නීති සංග්‍රහයේ පවිත්‍ර අපවිත්‍ර සතුන් පිළිබඳ නීති දස පනතේ සංවර්ධනය වී දක්නට ලැබෙන පනත් වන්නේ,

i. 1 හා 5 ii. 3 හා 6 iii. 2 හා 4 iv. 6 හා 10 v. 7 හා 4

Education NCP - www.edncp.lk

29. සැබෑ දිවැසිවරයෙකු හා බොරු දිවැසිවරු හඳුනා ගත හැක්කේ,
i. සැබෑ දිවැසිවරු බොරු දිවැස්වැකි කීම නිසා
ii. බොරු දිවැස්වරු සැබෑ දිවැසියන් සමග සිටි නිසා
iii. බොරු දිවැස්වරුන්ගේ දිවැස්වැකි ඉටු නොවීම
iv. බොරු දිවැසි ප්‍රමාණය වැඩිවීම
v. දෙපාර්ශවය අතර ගැටුම් සිදුවීම

30. ජෙරමියා යන නාමයේ අර්ථය,
i. කැඳවනු ලැබීම ii. තෝරා ගැනීම iii. උසස් කිරීම
iv. ප්‍රතික්ෂේප කිරීම v. නායකත්වය

31. මෙසියානු සංකල්පය ඉදිරිපත් කළ දිවැස්වරුන් දෙදෙනෙකි,
i. ජෙරමියා හා එසකියෙල් ii. යෙසායා හා මීකා iii. එසකියෙල් හා මීකා
iv. යෙසායා හා ජෙරමියා v. සාමුවෙල් හා ආමොස්

32." උදුරන්නට හා කඩා දමන්නටත් , නැති කරන්නට හා පෙළා දමන්නටත්"...... යන ප්‍රකාශයෙන් දිවැසි කැඳවීම ලැබුයේ,
i. යෙසායා ii. ජෙරමියා iii. එසකියෙල්
iv.මීකා v. සෙකරියා

33. යෙසායා දිවැසිවරයා බැබිලෝනියේ විනාශය සමාන කරන්නේ,
i. පාළු බිමකට, ii. සොහොන් ගෙයකට iii. වියලි බිමකට
iv. ගොහොරු බිමකට v. තැනිතලාවකට

34. මෙසියස් වහන්සේ බෙත්ලෙහෙමේ උපදින බව ප්‍රකාශ කළ දිවැසිවරයා ,
i. යෙසායා ii. ආමොස් iii. ජෙරමියා
iv. එසකියෙල් v. මීකා

35. පලස්තීන ජනතාව මත පටවා තිබූ බද්ධකි,
i. ඇඟ බද්ධ ii. ඉඩම් බද්ධ iii. වහල් බද්ධ
iv. දේවස්ථාන බද්ධ v. එඬේරික බද්ධ

36. දේව ගිවිසුම උල්ලංඝනය කළ ජනයාගේ දඬුවම,
i. දේව සම්මුඛයෙන් නෙරපීම ii. විප්‍රවාස ගතවීම iii. පොරොන්දු දේශය අහිමි වීම
iv. අවිශ්වාස වන්ත වීම v. ස්වර්ගය අහිමි වීම

37. එම්මානුවෙල් යන්නේ අර්ථය,
i. දෙවියන් වහන්සේ අප සමගය ii. ජේසුස් වහන්සේ අප සමගය iii. ශු. ත්‍රිත්වය අප සමගය
iv. ගැළවුම්කරු අප සමගය v. ශුද්ධාත්මයාණන් අප සමගය

38. ක්‍රිස්තු සමයේ සැන්හෙඩ්‍රින් සභාවේ නායකයන් වූයේ ,
i. අන්නාස් හා ජුදාස් ii. අන්නාස් හා කයිපස් iii. ජුදාස් හා ජොහාන්
iv. පිලාත් හා හෙරෝද් v. පිලාත් හා සීසර්

39. පලස්තීනය රෝම පාලනයට අනුව හැඩ ගැසුනේ,
i. එය ග්‍රීකයේ යටත් විජිතයක් නිසා
ii. හෙරෝද් රෝම වැසියකු නිසා
iii.පලස්තීනය සීසර් යටතේ පැවති නිසා
iv. පිලාත් රෝම ජාතිකයෙකු නිසා
v. පලස්තීන වැසියන් රෝමයට බදු ගෙවූ නිසා

40. ජුදා ජනතාව සිනගෝග පිහිටුවා ගනු ලැබුවේ,
i. නික්මයාම ගමනේදී ii. කානාන් දේශයේදී iii. අපර විප්‍රසවාස යුගයේදී
iv. පොරොන්දු දේශයේදී v. විප්‍රවාසී යුගයේදී

41. ජුදා නීතිය තුළ ගරුත්වයකින් සැළකුවද ජුදා අයිතිවාසිකම් හිමි නොවූ පිරිසක් වන්නේ,
i. සමරිතානු වරු ii. එසේනි වරු iii. ලේකම් වරු
iv. පරිසිවරු v. සදිසිවරු

42.දේව ශාපය ලත් අය ලෙස කොන් කරනු ලැබුවේ,
i. රෝගීන් ii. පව්කරරුවන් iii. අයකැමියන්
iv. සමරිතානුවන් v. එඬේරුන්

43. රෝම අධිරාජ්‍යයාට බදු ගෙවූ කාසි වර්ග 2 වන්නේ,
i. ඉන්දීය රුපියල් හා යූරෝ ii. ප්‍රංශ ප්‍රැන්ක් හා ඩිනාරි iii. රෝම දිනාරි හා ග්‍රීක ඩ්‍රැක්මා
iv. ජපන් යෙන් හා රෝම දිනාරි v. රුපියල් හා යූරෝ

Education NCP - www.edncp.lk

44. ක්‍රිස්තුස් වහන්සේ තම දූත මෙහෙවර ඇරඹුයේ,

i. එඬේරුන් සමග　ii. ධීවරයින් සමග　iii. කුඩා දරුවන් සමග
iv. පව්කරුවන් සමග　v. සුංගම් අය කරන්නන් සමග

45. ජුදා ආගමේ අවසාන යුගයේ බිහිවූ සමාජ පන්තිය ,

i. පරිසිවරු　ii. සදිසිවරු　iii. සමරිතානු වරු
iv. එසේනි වරු　v. ලේකම් වරු

46. රෝම නීතිය අනුව කුරුසියේ ඇණ නොගසන්නේ,

i. රෝම වරු　ii. ග්‍රීක වරු　iii. අන්‍ය ජාතකයින්
iv. සදිසිවරු　v. පලස්තිවරු

47. ක්‍රිස්තු සමයේ පලස්තීනයේ ආර්ථිකය පදනම් වූයේ,

i. කෘෂි කර්මාන්තය මත　ii.ධීවර කර්මාන්තය මත　iii. වෙළදාම මත
iv. රාජ්‍ය බලය මත　v. ධනපති පංතිය මත

48. සමදර්ශ සුභාරංචි ඒ නමින් හදුන්වන්නේ ,

i. ලේඛකයන් එකම මූලාශ්‍ර භාවිතා කළ නිසා
ii. සැකිල්ල හා අන්තර්ගතය සමාන නිසා
iii. එකම ස්ථානයක සිට ලියූ නිසා
iv. එකම කාල සීමාවකදී නිර්මාණය කළ නිසා
v. ක්‍රිස්තු ජීවිතයේ පැතිකඩ ඉදිරිපත් කළ නිසා

49. සුභාරංචි ග්‍රන්ථ ලේඛන ගත වීමේ අදියරයන්,

i. දෙකකි　ii. තුනකි　iii. හතරකි
iv. පහකි　v. හයකි

50. පීඩාවට පත් ජනයා දිරිමත් කරමින් තම සුවිශේෂය ඉදිරිපත් කළේ,

i. මාක් තුමා　ii. මතෙව් තුමා　iii. ලූක් තුමා
iv. ජොහාන් තුමා　v. පාවුළු තුමා　(2 × 50 = 100)

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 12

# දෙවන වාර පරීක්ෂණය - 2017

## ක්‍රිස්තියානි ධර්මය

පාසලේ නම : ........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ....................................................

.................................................... කාලය : පැය 03 යි.

## II කොටස

❖ I කොටසින් ප්‍රශ්න 2කට ද II කොටසින් ප්‍රශ්න 3 කට ද පිළිතුරු ලියන්න.

### I කොටස

(01) i. ශු. බයිබලයේ උපකෘත ක්‍රියා කරන ආකාරය කරුණු 4 කින් පෙන්වන්න.
ii. දේවානුභාවය දෙවියන් විසින් දානය කරන දීමනාවක් බව කරුණු 4 කින් දක්වන්න.
iii. දෙවිඳුන් මානව රූපාකාරයෙන් දැක්වෙන බවට නිදසුන් 4 ක් ලියන්න.
iv. ප්‍රාග් ඉතිහාසයේ සඳහන් වන ප්‍රධාන කතා පුවත් 4 ක් නම් කරන්න.
i. මිනිසාගේ වැටීමෙන් පසු බිඳී ගිය සම්බන්ධතා 4 මොනවාද? (4 × 5 = 20 )

(02) i. පුරාණ පෙරදිග ලෝකයේ ගිවිසුම් වල ලක්ෂණ 2 ක් හා බයිබලීය ගිවිසුම් වල ලක්ෂණ 2 බැගින් ලියන්න.
ii. දිවැසිවර කැඳවීමේ පියවර 4 ක් පිළිවෙලින් ලියන්න.
iii. පංච පුස්තකය තුළ ඇති ධාර්මික තේමා 4 ක් දක්වන්න.
iv. දස පනතේ විශේෂ ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.
ii. දිවැසිවරුනට පැවරූ ප්‍රධාන කාර්‍යයන් 4 ක් ලියන්න. (4 × 5 = 20 )

(03) i. සීනයි ගිවිසුම ස්ථිර කිරීමේ පළමු අදියර කරුණු 4 කින් දක්වන්න.
ii. මෙසියස් තුමාගේ සුලක්ෂණ 4 ක් සඳහන් කරන්න.
iii. ජුදා ජාතිකයින් පැවැත්වූ ප්‍රධාන මංගල්‍යය 3 ක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.
iv. පොරොන්දු දේශයේදී තෝරා ගත් ජන නායකයින් විසින් සිදු කළ මෙහෙයන් 4 ක් (කාර්‍යයන්) ලියන්න.
iii. ගලීල ප්‍රදේශය ආශ්‍රිතව සිදුවූ සිදුවීම් 4 ක් ලියන්න. (4 × 5 = 20 )

### II කොටස

(04) i. දේවානුභාවය යනු කුමක්දැයි හඳුන්වා එය ක්‍රියාත්මක වන ආකාර තුන කරුණු 5 කින් විස්තර කරන්න.
ii. ආදී පියවරුන්ගේ කැඳවීම, ගිවිසුම, ඇදහිල්ල පිළිබඳ ආදර්ශ 5 ක් නිදසුන් දෙමින් විස්තර කරන්න.

(05) i. ජීවිතයේ කටුක අත්දැකීම් මගින් ප්‍රේමය තේරුම් ගත හැකි බව නික්මයාම ගමන ඇසුරෙන් පෙන්වන්න.
ii. ඊශ්‍රායෙල් ජනයාගේ පාපයන්ට දඬුවම විප්‍රවාස ගත වීමයි. එමගින් ඔවුන් සිය ජීවිත වෙනස් කර ගත්හ. නූතන කිතුනුවාට තම පාපයන්ගෙන් හැරීමට ඇති අවස්ථා නම් කර ජීවිත වෙනස් කර ගත යුතු අයුරු වචන 100 කින් දක්වන්න.

(06) i. ස්වාමින් වහන්සේගේ සේවකයා තුළින් ඉස්මතු වන චරිත ලක්ෂණ 5 ක් නම් කර එම කරුණු ඔබේ දිවියට වැදගත් වන අයුරු විස්තර කරන්න.
ii. පලස්තීන ජන ජීවිතය තුළ ජීවත් වුවද ක්‍රිස්තුන් වහන්සේ තම අභිමානය එහි රඳවා ගනිමින් සෙසු ජනතාව දෙවිඳුන් කෙරේ යොමු කළ අයුරු නිදසුන් 5 කින් විස්තර කරන්න.

(07) i. සමදර්ශක සුවිශේෂක වල ඇති අසමානකම් 5 ක් ලියන්න.
ii. සමදර්ශක සුභාරංචි වල අසමානතා ඇතිවීමට පාදක වන කරුණු 5 ක් වචන 100 කින් පමණ ලියන්න.

(08) i. දිවැසිවර ඉගැන්වීම් හි "ගිවිසුම" යන්න පැහැදිලි කිරීමට යොදා ගන්නා නිදසුන් 5 ක් දක්වන්න.
ii. දේව රාජ්‍ය ප්‍රතිපත්ති දැක්වෙන කන්ද උඩ දේශනය නූතන කිතුනු දිවියේ ප්‍රතිපත්ති සකසා ගැන්මට අදාල වන අයුරු වචන 100 කින් පමණ නිදසුන් සහිතව පෙන්වන්න. (එක් පිළිතුරක් සඳහා ලකුණු 10 බැගින්)

Education NCP - www.edncp.lk